# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2046/88 - 2017 නොවැම්බර් මස 25 වැනි සෙනසුරාදා - 2017.11.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2018

### ඡන්ද හිමි නාමලේඛන ප්‍රදර්ශනය කිරීම

ඉදිරියේදී පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා භාවිතා කරනු ලබන්නේ 2017 ඔක්තෝබර් මස 12 දින සහතික කරනු ලැබූ 2017 වර්ෂය සඳහා වූ එනම් පාර්ලිමේන්තු මැතිවරණ සඳහා වූ ඡන්දහිමි නාමලේඛනය පදනම් කර ගනිමින් ඒ ඒ පළාත් පාලන ආයතන සඳහා තේරීම්භාර නිලධාරීන් විසින් පිළියෙල කර ඇති ඡන්දහිමි නාමලේඛනය බවත්, එම නාමලේඛන අදාළ තේරීම්භාර නිලධාරීන් විසින් ඒ ඒ පළාත් පාලන ආයතනවල ප්‍රදර්ශනය සඳහා තබා ඇති බවත් මහජනතාව වෙත මෙයින් නිවේදනය කර සිටිනු ලැබේ. 2017 ඡන්දහිමි නාමලේඛනයේ නම් ඇතුළත් සියලුම ඡන්දහිමියන්ගේ නම් මෙම නාමලේඛනවල ඇතුළත් කිරීමට ක්‍රියා කර ඇති බවද නිවේදනය කරනු ලැබේ.

ස්වකීය නම නිසි පරිදි අදාළ පළාත් පාලන ආයතනයේ නාමලේඛනයේ ඇතුළත්ව නැති බව යම් ඡන්දහිමියකුට පෙනී යන්නේ නම් හෝ නුසුදුසු අයකුගේ නම් ඇතුළත්ව ඇති බව පෙනී යන්නේ නම් හෝ ඒ බව 2017 දෙසැම්බර් 05 දින හෝ එදිනට පෙර ඒ ඒ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ තේරීම්භාර නිලධාරී වෙත ලියවිල්ලකින් දැනුම් දිය හැකි බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ පිළිබඳව අදාළ දැන්වීම් සියලුම පළාත් පාලන ආයතනවල ප්‍රදර්ශනය කිරීමට තේරීම්භාර නිලධාරීන් මේ වන විටත් ක්‍රියාකර ඇති බවද මෙයින් නිවේදනය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| මහින්ද දේශප්‍රිය | එන්. ජේ. අබේසේකර | එස්. රත්නජීවන් එච්. හූල් |
| සභාපති | සාමාජික | සාමාජික |
| මැතිවරණ කොමිෂන් සභාව | මැතිවරණ කොමිෂන් සභාව | මැතිවරණ කොමිෂන් සභාව |

2017 නොවැම්බර් මස 25 වැනි දින,
රාජගිරිය,
සරණ මාවත,
මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී ය.


1A - G 26154 — 107 (2017/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*